# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2371/59 - 2024 පෙබරවාරි මස 17 වැනි සෙනසුරාදා - 2024.02.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත ( 460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : 3/2/3/10/269-A (II).
*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4/3/9/2016/ WS/417.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැවින්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :-

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 363 වැලිකඩමුල්ල ග්‍රාම නිලධාරි වසමේ වැලිකඩමුල්ල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවට ගම්පහ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙළ කරන ලද මු.පි.ගම්. 4229 සහ 2021.01.26 දිනැති පිඹුරේ දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 3.9975ක් වන ඉඩම :

සැළකිය යුතුයි - මු.පි.ගම්. 4229 පිඹුරේ කැබලි අංක 14 ලෙස සටහන් වන ඉඩම් කොටස ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(ආ) 1 වගන්තිය යටතේ අවසතු කිරීමට තීරණය කර ඇති බැවින් ඉහත පිඹුරේ මුළු හෙක්ටයාර් ප්‍රමාණය වන හෙක්. 4.9289 න් හෙක්. 0.9314ක් අඩු කර ඇත.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2024.03.22 දින පෙ.ව. 10.00 ට අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2024.03.15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එස්. පී. ගුණවර්ධන,
ප්‍රාදේශීය ලේකම්,
අත්තනගල්ල.

2023 දෙසැම්බර් මස 19 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 02 - 0129




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධි පත්‍රිකාව

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත ( 460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : DIVMW/LAD/CEPLA/6/1/11.
*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/7/2018/HW/434.

2023 ජුනි 13 වැනි දින පළවූ අංක 2336/36 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සඳහන් වූ අ.ග.පි. 1525 අතිරේක 6 පත්‍ර අංක 6 හි සඳහන් කැබලි අංක 289 සිට 314 දක්වා ඉඩම් කැබලි 22ක් සඳහා හිමිකම් පරීක්ෂණය '2023 සැප්තැම්බර් 27' ලෙස සඳහන් වුවද එය '2024 මාර්තු 11' දින ලෙස සංශෝධනය විය යුතු ය.

ඉවත් කළ යුතු දිනය : 2023 සැප්තැම්බර් 27
ආදේශ කළ යුතු දිනය : 2024 මාර්තු 11

එම්. එස්. ජානක,
ප්‍රාදේශීය ලේකම්,
මාවතගම.

2024 ජනවාරි මස 12 වැනි දින,
මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 02 - 0130

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : BD/HE/LND/05/56.
*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/9/2015/WS/94.

අංක 2361/53 හා 2023.12.09 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* 3A පිටුවේ සඳහන් "2024 ජනවාරි මස 24" වෙනුවට "2024 මාර්තු මස 27" යනුවෙන් ආදේශ විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ඩබ්. එම්. සී. වීරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
හාලිඇල.

2024 පෙබරවාරි මස 14 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 02 - 0131

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.